සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11 |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණය | II | පැය දෙකයි |
| விவசாய மற்றும் உணவுத்தொழினுட்பவியல் | II | இரண்டு மணித்தியாலம் |
| **Agri & Food Technology** | **II** | ***Two hours*** |

- **පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

දේශීය බෝග වගාවට අතහිත දීමක් ලෙස සෞඛ්‍ය ආරක්ෂිත ආහාර බෝග ප්‍රචලිත කිරීමක් ලෙසත් අපේ ආහාර ජනප්‍රිය කිරීම සඳහා කෘෂි ක්ෂේත්‍රය ප්‍රමුඛ වී ඇත.

(01)
i) බෝග වගාව සඳහා සුදුසු පසක තිබිය යුතු භෞතික ගුණාංග දෙකක් නම් කරන්න.

ii) බෝග වගාවේදී භාවිතා කල හැකි කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.

iii) බෝග වගාවකින් ප්‍රශස්ත අස්වැන්නක් ලබාගැනීමට බලපාන කාලගුණික පරාමිතීන් දෙකක් නම් කරන්න.

iv) ඔබ ගෙවත්තේ පැපොල් සහ බතල වගාවක් ආරම්භ කිරීමට අදහස් කරයි නම්, ඒ සඳහා සුදුසු පාත්ති වර්ගය බෝගය අනුව සඳහන් කරන්න.

v) මිරිස්, බටු, තක්කාලි වැනි බෝග සිටුවීමට තවාන් සකස් කිරීමේදී තවාන් මාධ්‍ය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය හා අනුපාතය සඳහන් කරන්න.

vi) ගෙවතු වගාවට යොදාගත හැකි පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම දෙකක් නම් කරන්න.

vii) ඔබ ගෙවත්තේ ලෙමන් හා දෙහි ශාක ඇත්නම් එහි පැළ ප්‍රචාරණය සඳහා යොදාගත හැකි ලේයර් ක්‍රමයක් රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.

viii) උඩරට ගෙවතු වගාවේදී මිශ්‍ර බෝග වගා ක්‍රමයට බෝග වගාව සිදු කරනු ලැබේ. මෙහි ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

ix) පරිසර හිතකාමී පළිබෝධ පාලනය කිරීම සඳහා උපයෝගී වන පලිබෝධකයින්ගේ ස්වාභාවික සතුරන් දෙදෙනෙකු උදාහරණ සහිතව නම් කරන්න.

x) ප්‍රවාහණයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කර ගැනීමට ඔබ යොදාගන්නා උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(02) බීජ වලින් හැර ශාකයේ අනෙකුත් කොටස්වලින් නව ශාක බිහිකර ගැනීම වර්ධක ප්‍රචාරණයයි. මේ සඳහා මව් ශාකයේ විවිධ වර්ධක කොටස් භාවිතා කරයි.

I. (a) මුල් කැබලි හා පත්‍ර කැබලි මගින් ප්‍රචාරණය කරගත හැකි බෝග වර්ග දෙක බැගින් වෙන වෙනම සඳහන් කරන්න. (ල - 02)

(b) දඬු කැබලි මුල් ඇදීම උත්තේජනය කිරීමට යොදාගන්නා ක්‍රම දෙකක් නම් කරන්න. (ල - 02)

II. (a) බද්ධ කිරීම සඳහා යොදාගන්නා ග්‍රාහකයක තිබිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල - 01)

(b) අඹ පැලයකට ආරුක්කු බද්ධයක් සිදුකරන ආකාරය නම් කරන ලද රූප සටහනකින් පැහැදිලි කරන්න. (ල - 03)

III. වර්ධක ප්‍රචාරණයේ වාසි 4 ක් සඳහන් කරන්න. (ල - 02)

(03) බෝග වගාවේදී පෝෂක ඌණතා මගහරවා ගැනීම සඳහා පොහොර යොදනු ලැබේ.

I. (a) බෝගවල පැවැත්ම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රව්‍ය හතරක් සඳහන් කරන්න. (ල - 02)

(b) පොටෑසියම් හිඟවීම නිසා ශාකවල දක්නට ලැබෙන ඌණතා ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල - 02)

II. (a) බෝගවලට පොහොර යෙදිය හැකි ක්‍රම හතරක් සඳහන් කරන්න. (ල - 02)

(b) බෝගවලට රසායනික පොහොර යෙදීමෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න (ල - 01)

III. (a) කොළ පොහොර ලෙස යොදාගත හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න (ල - 01)

(b) තම ගොවිපළේදීම නිපදවාගත හැකි කාබනික දියර පොහොර වලට උදාහරණ දෙකක් සඳහන් කරන්න. (ල-02)

(04) ක්‍රමවත් ලෙස බිම් සැකසීම හා ජල පාලනය බෝග වගාවේදී උසස් අස්වැන්නක් ලබා ගැනීමට ඉවහල් වන ක්‍රමෝපායකි.

I. (a) බිම් සැකසීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල - 02)

(b) මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක නම් කරන්න. (ල - 02)

II. (a) කෝනෝ වීඩරය හෝ උපකරණය සහ තුන් පුරුක් කල්ටිවේටරය කුමන කාර්යයන් සඳහා භාවිතා කරන්නේද? (ල-01)

(b) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවියෙකුට බඩ ඉරිඟු, සෝයා බෝංචි, මුං ඇට වැනි බීජ වැපිරීමට වඩාත් සුදුසු උපකරණයක් නම් කරන්න. (ල - 01)

III. (a) වී වගාව සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය සඳහන් කර එහි වාසි දෙකක් දක්වන්න. (ල - 03)

(b) පසක ජල වහනය දියුණු කිරීමට යොදාගත හැකි කාණු රටා දෙකක් සඳහන් කරන්න.(ල - 01)

(05) සාර්ථක බෝග අස්වැන්නක් ලබා ගැනීම සඳහා පලිබෝධ හානි අවම කිරීම ඉතා වැදගත් වේ. බිම් සැකසීමේ සිට අස්වනු නෙලීම දක්වා සියලුම ක්‍රියාකාරකම් පලිබෝධ හානි අවම කිරීම සඳහා අවධානය යොමු කල යුතුය.

I. (a) වැඩෙන ස්ථානය අනුව වල්පැළෑටි වර්ගීකරණය දක්වා ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල - 02)

(b) බෝග වගාවේදී වල්පැළෑටි පාලනය කිරීම සඳහා යොදාගත හැකි රසායනික නොවන ක්‍රම හතරක් ලියන්න. (ල - 02)

II. (a) කෘමි පළිබෝධකයින් බෝග වලට හානි කරන ආකාර දෙකක් සඳහන් කොට ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල - 02)

(b) පරිසර හිතකාමී කෘමි පළිබෝධ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල - 01)

III. පලතුරු සහ එළවළු බෝග වලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගයේ ලක්ෂණ දෙකක් හා එම රෝගය පාලනය සඳහා යොදා ගත හැකි ක්‍රම දෙකක් ලියන්න. (ල - 03)

(06) සංවර්ධිත රටවල පසු අස්වනු හානිය 10% පමණ වේ. ශ්‍රී ලංකාවේ ඇතුළු සංවර්ධනය වන රටවල එය 20% - 40% අතර අගයක් ගනී. නිෂ්පාදන වල මිල කෙරෙහි මේ තත්වය සෘජුවම බලපානු ඇත.

I. (a) පසු අස්වනු හානිය කෙරෙහි පෙර අස්වනු සාධක බලපානු ලබයි. එවැනි පෙර අස්වනු සාධක 2 ක් නම් කරන්න. (ල - 01)

(b) පසු අස්වනු හානිය වැලැක්වීම, ගොවියාට වැදගත් වන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල - 02)

II. (a) අස්වනු ගබඩා කිරීමේදී නිසි අයුරින් සිදු නොකිරීම නිසා සිදුවන හානි අවස්ථා 02 ක් ලියන්න. (ල - 02)

(b) අලෙවියේදී අස්වැන්නට ගුණාත්මක වශයෙන් සිදුවන හානි අවස්ථා 02 ක් සඳහන් කරන්න. (ල - 02)

III. පසු අස්වනු හානියේ අලාභය පාරිභෝගිකයා වෙත පැවරෙන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න. (ල - 03)

(07) ගොවිපළ හිමිකරුවන් ගොවිපලේ සතුන් පිළිබඳ නිතර පරීක්ෂාවෙන් සිටීම තුළින් තම ගොවිපලේ කටයුතු මනාව පවත්වාගෙන යා හැකිය.

I. ගොවිපලේ සතුන්ගේ පහත සඳහන් ලක්ෂණ දක්නට ලැබුණි නම් ඊට හේතු එක බැගින් සඳහන් කරන්න.

a. කිරි ගවයෙකු බෙල්ල පසුපසට හරවා සිහි මඳගතියෙන් බිම වැතිර සිටීම.

b. කිකිළි බිත්තර වල කටුව තුනී ස්වභාවයක් ගැනීම.

c. ලේ සහිත දුඹුරු පැහැති කුකුළු වසුරු (මළද්‍රව්‍ය) තිබීම.

d. බෲඩරය තුළ කුකුළු පැටවුන් එක් තැනක එකට ගුලි වී සිටීම. (ල - 02)

II (a) ගව නිවාසයක තිබිය යුතු අංග තුනක් සඳහන් කරන්න. (ල - 03)

(b) ගව නිවසක එක් කිරි ගවයෙකු සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය කොපමණද? (ල - 01)

III. (a) ඝන ආස්තරණ ක්‍රමයේදී අතුරුණුව සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න. (ල - 01)

(b) හොඳ අතුරුණුවක තිබිය යුතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල - 03)